පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO: 1574 / 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி
දිනය / Date: 14/12/2023 පැය 1250

# මාධ්‍ය නිවේදනය

## බැඩ්මින්ටන් තරඟ ජයග්‍රහණයක්.

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය මගින් සංවිධානය කරන ලද "71 වන ජාතික බැඩ්මින්ටන් ශූරතා තරඟාවලිය " 2023.12.04 වන දින සිට 2023.12.10 වන දින දක්වා කොළඹ වෙළඳ සේවා ක්‍රීඩාංගණයේදී පැවත්විණි. මෙම තරඟාවලිය සඳහා දිවයින පුරා විවිධ ක්‍රීඩා සමාජ 60 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 700 ක් පමණ සහභාගී වූ අතර, විවෘත කේවල, යුගල හා මිශ්‍ර යුගල සහ වයස අවුරුදු 11 න් පහල සිට අවුරුදු 60 දක්වා විවිධ වයස් කාණ්ඩ යටතේද තරඟ පැවැත්විණ.

මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩකයන් තිදෙනෙකු සහභාගී වූ අතර, උප පොලිස් පරීක්ෂක වන මධූක දුලාංජන නිලධාරියා තරඟාවලියේ විවෘත පිරිමි යුගල ජාතික අනු ශූරතාවය සහ විවෘත මිශ්‍ර අනුශූරතාවය දිනාගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් බැඩ්මින්ටන් කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ටී.සී.ඒ. ධනපාල මහතා කටයුතු කරන අතර, එහි ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඊ.ඒ.එම්.එස්. දෙහිදෙනිය මහතා ද, කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක පී.සී.ඩබ්. පල්ලියගුරුගේ මහතා කටයුතු කරනු ලබයි.







මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.